**මාර්ග සංවර්ධන අධිකාරිය - 2019**

**---------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මාර්ග සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්ථාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ (අදාළ පරිදි) පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---------------------

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව මහාමාර්ග වැඩිදියුණු කිරීමේදී, පුළුල් කිරීමේදී සහ අධිවේගී මාර්ග ගොඩනැගීමේදී අත්පත් කරගෙන තිබූ රු.මිලියන 84,721 ක් වූ ඉඩම් මූල්‍ය ප්‍රකාශණවල වෙන්ව දක්වා නොතිබුණි. එසේම මෙම ඉඩම් කැබලිවල අදාල ඉඩම් ලේඛණයක්ද අධිකාරිය නඩත්තු කර නොතිබුණි. | අධිවේගී මාර්ග හා ව්‍යාපෘති වලින් ඉදිකර අධිකාරිය වෙත භාරදෙනු ලැබූ මාර්ග වලට අදාල ඉඩම් අත්පත් කර ගැනීමේ වටිනාකම් එම මාර්ග ඉදිකිරීමට දරණ ලද ගෙවීමක් වන බැවින් එම ඉඩම් අත්පත් කරගැනීමට දරණ ලද පිරිවැය අධිවේගී මාර්ග වල පිරිවැයෙහි ඇතුලත් කර ඇත. එබැවින් ඉඩම් වශයෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමක් සිදුකර නොමැත. | නිශ්චිත ඵලදායී ජීවකාලයක් සහිත අධිවේගී මාර්ග හා ඵලදායි ජීව කාලය අසීමිත ඉඩම් මූල්‍ය ප්‍රකාශණවල වෙන්වෙන්ව නිරූපනය කල යුතුය. |
| (ආ) පිළිවෙලින් අධිකාරියට අයත් පිරිවැය රු. මිලියන 776.98 ක් වූ වාහන 227 ක් හා පිරිවැය රු.මිලියන 176.03 ක් වූ ගොඩනැගිලි 2019 ජනවාරි 01 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද එම වාහන හා ගොඩනැගිලි දැනටමත් භාවිත කරමින් පැවතුණි. එසේවුවත් රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව එම වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණවලට අනුව ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තුවන පියවරයන් මෙම පිළිතුරු ලිපියෙහි ඇමුණුමෙහි දක්වා ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීවිත කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කර ගිණුම්වල ගැලපීමට කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රමිතියේ 58 වගන්තිය ප්‍රකාරව අස්ථිත්වයේ දේපළ, පිරියත හා උපකරණවල ප්‍රධාන අංගයන්හි ඵලදායී ජීවිත කාලය එකිනෙකට වෙනස් වනවිට එම අංගයන් එකිනෙකට වෙනස් වූ ක්ෂය අනුපාතයන් මත ක්ෂය කළ යුතුය. එසේ වුවත් එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයන් සහිත අධිවේගී මාර්ගවල මූලික අංගයන් සඳහා වෘත්තීමය තක්සේරුවක් මත ක්ෂය අනුපාත තීරණය කර නොතිබුණි. | එකිනෙක කොටස් වෙන් වෙන් වශයෙන් හදුනාගැනීම සඳහා තොරතුරු කැදවා ඇත. ලද තොරතුරු වල පවතින අඩුපාඩු සම්පූර්ණ කර අදාල තොරතුරු ලබාගත් පසුව ඉදිරියේදී ක්ෂය ප්‍රතිපත්තිය තීරණය කර ගිණුම් වල නිසි ගැලපුම් සිදුකරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රමිතියේ 58 වගන්තිය ප්‍රකාරව එකිනෙකට වෙනස් වූ ඵලදායී ජීවිත කාලයන් සහිත අධිවේගී මාර්ගවල මූලික අංගයන් සඳහා වෘත්තීමය තක්සේරුවක් මත ක්ෂය අනුපාත තීරණය කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, මාර්ග සංවර්ධන අධිකාරියට සෘජු ප්‍රතිලාභ නොලැබෙන තෙලගපාත පොලිසිය වෙනුවෙන් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ පිරිවැය වූ රු.මිලියන 80.8 ක් හා එකී ගොඩනැගිල්ලේ වාර්ෂික ක්ෂය රු.මිලියන 4.04 ක් අධිකාරියේ ගිණුම්වල දක්වා තිබුණි. | ගොඩනැගිලි පිරිවැය තුල ඇතුලත් තෙලගපාත පොලීසිය වෙනුවෙන් ඉදිකල ගොඩනැගිල්ල අධිවේගී මාර්ගයන්හි මෙහෙයුම් කටයුතුවල නියුතු පොලිස් නිලධාරීන් සඳහා අධිවේගි මාර්ග පොලිස් මුරපොල සංකීර්ණයක් ලෙස ස්ථාපිත කර ඇත.මෙම ගොඩනැගිල්ල අධිකාරියේ වත්කමක් ලෙස පෙන්වීම ගිණුම් කරන ප්‍රමිත අංක 01ට අදාල වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුව, මාර්ග සංවර්ධන අධිකාරියට සෘජු ප්‍රතිලාභ නොලැබෙන දෑ වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශණවල නිරූපනය නොකල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුවිශේෂී කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන පිරිවැය රු.මිලියන 90.18 ක් වූ උපකරණ සහිත වාහනය සඳහා යොදා ගනු ලබන ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශණවල සමඟ හෙළිදරව් කර නොතිබුණි. | විදේශ ආධාර වර්ගීකරණය වාහන සඳහා ක්ෂය ප්‍රතිපත්තිය ඉදිරි මූල්‍ය වාර්තාවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | අධිකාරිය භාවිතකරණ සියලු වත්කම් වලට අදාල ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශණවල සමඟ හෙළිදරව් කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියට අයත් A සහ B මාර්ගයන්ගේ මුළු දුර ප්‍රමාණයකිලෝමීටර් 12,210 ක් වුවත් 2019 වර්ෂය දක්වා A ශ්‍රේණියේ මාර්ග 08 කට සහ B ශ්‍රේණියේ මාර්ග 52 කට අයත් කිලෝමීටර් 1,624.24 ක් පමණක් ප්‍රග්ධනිත කර තිබුණි. තවද 2019 දෙසැම්බර් 31 දිනට මාර්ග අංශ සහයක ව්‍යාපෘතිය මගින් ඉදිකිරීම් අවසන් කර අධිකාරිය වෙත භාරදී තිබූ පිරිවැය රු.මිලියන 37,040 ක කි.මීටර් 627.78 ක මාර්ග ප්‍රාග්ධනිත කිරීමටද කටයුතු කර නොතිබුණි. | අධිකාරිය විසින් මාර්ග ප්‍රාග්ධන කිරීමේ ක්‍රියාවලිය 2018 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී.<br><br>එම මාර්ග වල තොරතුරු විධායක ඉංජිනේරුවරුන්ගෙන් කැඳවා එම තොරතුරු ලද පසු අදියරෙන් අදියර ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කළමණාකාරිත්වය සාකච්ඡා කර ඇත. | අධිකාරියට අයත් A සහ B මාර්ගයන් සියල්ලම ඉතා කඩිනමින් ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ II කොටසේ ඉදිකිරීම් සඳහා 2019 නොවැම්බර් 04 දින ලංකා බැංකුව සමඟ එළඹ තිබූ රු.මිලියන 4,312 ක ණය ගිවිසුම අනුව රු. මිලියන 1,500 ක ස්ථාවර තැන්පතුවක් ඇපකරයක් ලෙස | 2020 වර්ෂයේදී මූල්‍ය වාර්තා වල ගිණුම්කරණ සටහන් යටතේ හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | **අධිකාරිය ඇපකර වශයෙන් තබා ඇති සියලු වත්කම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශණ තුල හෙළිදරව් කල යුතුය.** |

| | | | |
|---|---|---|---|
| | තබා තිබූ නමුත් එය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | | |
| (ඇ) | අධිකාරිය සතුව කිසිදු පිරිවැයක් සඳහන් නොවූ වාහන 351 ක් පැවති නමුත් මෙම මෝටර්වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණවලට අනුව ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තුවන පියවරයන් මෙම පිළිතුරු ලිපියෙහි ඇමුණුමෙහි දක්වා ඇත. | අධිකාරිය සතුව කිසිදු පිරිවැයක් සඳහන් නොවූ වාහන ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | බ්‍රිතාන්‍ය යකඩ පාලම් ව්‍යාපෘතිය මගින් සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරිය වෙත භාරදී තිබූ රු.මිලියන 242.29 ක වටිනාකමින් යුත් වත්කම් මූල්‍ය ප්‍රකාශණවලට ඇතුළත් කර නොතිබුණි. | එම ව්‍යාපෘතිය මගින් අධිකාරිය වෙත භාරදෙන ලද රු.මිලියන 242.29 වටිනාකමින් යුත් වත්කම්ද ප්‍රාග්ධනිත කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දෙන ලෙස ව්‍යාපෘතිය වෙත දන්වා ඇති අතර එම තොරතුරු ලද පසු ගිණුම් වල නිසි ගැලපුම් සිදු කරනු ලැබේ. | **ව්‍යාපෘති වලින් අධිකාරිය වෙත භාරදෙන ලද සියලු වත්කම් මූල්‍ය ප්‍රකාශණ තුල ඇතුලත් කල යුතුය.** |
| (ඉ) | අධිකාරියේ අධිවේගී මාර්ග 05 කට අදාලව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වීම් ලෙස රු.මිලියන 5,775 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද අධිකාරියේ ක්ෂය ප්‍රතිපත්තිය මත පදනම්ව විගණනය විසින් සිදුකල ගණනය කිරීම් අනුව එකී වාර්ෂික ක්ෂය වටිනාකම රු.මිලියන 5,885 ක් විය. ඒ අනුව අධිවේගී මාර්ග ක්ෂය රු.මිලියන 190 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අධිවේගී මාර්ග ව්‍යාපෘති 5කට අදාලව 2019-12-31 දිනට ක්ෂය ගණනය කිරීම සම්බන්ධයෙන් ඇති වෙනස්වීම් වලට අදාල ගිණුම් නිවැරදි කර ඇත. | **මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේ දී හැකිතාක් ගණිතමය දෝශ අවමකර ගත යුතුය.** |
| (ඊ) | පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතියේ අදියර II සහ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ අදියර III මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා දී තිබූ රු.මිලියන රු.මිලියන 530.87 ක් වූ ගොඩනැගිලිවල වටිනාකම ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි. | පිටත වටරවුම මාර්ගයේ අදියර 2 මගින් රු. මිලියන 71.15ක පිරිවැය වූ නිවාස සහ කාර්යාල ගොඩනැගිලි මාර්ග සංවර්ධන අධිකාරිය වෙත විධිමත්ව බාරදී ඇත්තේ 2019 වර්ෂය අගදී වුවද එහි නිවැරදි වටිනාකම් අධිකාරිය වෙත ලබා දී ඇත්තේ 2020 වර්ෂයේ ජූනි මසදී වන අතර ඊට අදාල පිරිවැය එම මස ජර්නල් අංක 232/J06 මගින් ගිණුම් ගත කර ඇත. | **ව්‍යාපෘති වලින් අධිකාරිය වෙත භාරදෙන ලද සියලු වත්කම් මූල්‍ය ප්‍රකාශණ තුල ඇතුලත් කල යුතුය.** |
| (ඉ) | අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබූ වත්කම් ලේඛනයට අනුව පිරිවැය හා ශුද්ධ පොත් අගය පිළිවෙලින් රු.මිලියන 136.89 ක් හා රු.මිලියන 54.92 ක්වූ වාහන 06 ක් ගිණුම්වල දෙවරක් සටහන් වී තිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වාහනවල අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති මඟින් මිලදී ගෙන අධිකාරිය වෙත භාරදී | දේශීය අරමුදල් බැංකු ව්‍යාපෘතිය මගින්ද අනිකුත් ව්‍යාපෘති වශයෙන් යාන්ත්‍රික අංශය මගින්ද මුදල් අංශයට එකම වාහනය දෙවරක් වාර්තා කර තිබීම නිසා මෙම වෙනස හට ගෙන ඇත.<br><br>අදාල තොරතුරු මුදල් අංශය වෙත ලැබී ඇත්තේ 2020 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසවලදී බැවින් 2020 | **මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේ දී හැකිතාක් ගණිතමය දෝශ අවමකර ගත යුතුය.තවද මූල්‍ය ප්‍රකාශණ සකස්කරන විට අවශ්‍ය සියලු තොරතුරු නියමිත අවස්ථාවේදී ලබා ගත යුතුය.** |

| | | | |
|---|---|---|---|
| | තිබූ වාහන 14 ක පිරිවැය හා ඊට අදාල සමුච්චිත ක්ෂය පිළිවෙලින් රු.මිලියන 494.98 ක් හා රු.මිලියන 1.52 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | වසරේ ගිණුම් ගත කරන ලද බව දන්වමි. | |
| (ඊ) | දැන්වීම් පුවරු ආදායම ගිණුම් තැබීමේදී උපචිත පදනම සැලකිල්ලට නොගැනීම නිසා රු.මිලියන 11.85 ක් වූ ඉදිරියට ලද ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගැනීම නිසා වර්ෂයේ ආදායම හා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | මෙ සම්බන්ධව 2021 වර්ෂයේ සිට ගිණුම් ගත කිරීමට හැකි වන පරිදි ආදායම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>කලින් ලද ආදායම් නිවැරදිව ගිණුම් ගත කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | **මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේ දී** උපචිත පදනම සැලකිල්ලට ගත යුතුය. |
| (උ) | 2019 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල දැක්වෙන ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම් ආරම්භක ශේෂය, වර්ෂයේ ක්ෂය හා වර්ෂ අවසාන ක්ෂය වෙන්කිරීම් ශේෂයන් හා ඊට අදාල වත්කම් ලේඛනයේ ශේෂයන් අතර රු.මිලියන 206.2 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම වාහන 14 ක් පිළිබඳ අධිකාරියේ මූල්‍ය අංශය මගින් නඩත්තු කරන වත්කම් ලේඛනය හා එම වාහනවල අදාල යාන්ත්‍රික අංශය නඩත්තු කරන ලේඛන අතර රු.මිලියන 26.33 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, අධිකාරිය සතු වාහන 03 ක් මූල්‍ය අංශයේ වත්කම් ලේඛනයට ඇතුළත් නොකිරීම නිසා, වාහනවල පිරිවැය රු.මිලියන 17 කින් හා සමුච්චිත ක්ෂය රු.මිලියන 4.56 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශණවල දැක්වුණි. | මෙහි සඳහන් කොට ඇති ක්ෂය ප්‍රමාණයන්ගේ වෙනස අත පසුවීමකින් සිදු වූ අතර ජර්නල් සටහන් අංක108/J03 - 2020 මගින් නිවැරදි කර ඇත. | **මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේ දී හැකිතාක් ගණිතමය දෝශ අවමකර ගත යුතුය.තවද මූල්‍ය ප්‍රකාශණ සකස්කරන විට අවශ්‍ය සියලු තොරතුරු නියමිත අවස්ථාවේදී ලබා ගත යුතුය.** |
| (ඌ) | දේශීය බැංකු ණය මගින් අරමුදල් සපයන සහ රජයේ අරමුදල් (GOSL) මගින් සිදුකරන ලද මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මිලදී ගෙන තිබූ රු. මිලියන 316.98 ක වත්කම්, මාර්ග පිරිවැයෙන් ඉවත් කර වෙනම ප්‍රාග්ධනිත කර තිබුණු නමුත් එම වත්කම්වලට අදාල විස්තර විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | දැනටමත් දේශීය බැංකු අරමුදල් මගින් මිලදී ගත් වත්කම් බොහෝමයක් ප්‍රාග්ධනිත කර ඇති අතර මෙහි සඳහන් කර ඇති වටිනාකමට අදාලව එම අංශයෙන් තොරතුරු කැඳවා ඇත. ඉදිරියේදී අදාල තොරතුරු ලැබුනු පසු එම වත්කම්ද වත්කම් ලේඛනයේ දැනටමත් සටහන් කර ඇති දේශීය බැංකු අරමුදල් මගින් මිලදී ගත් වත්කම් හා සැසඳීම් සිදු කර අවශ්‍ය ගැලපුම් ඉදිරියේදී කරනු ලැබේ. | **මූල්‍ය ප්‍රකාශණ සකස්කරන විට අවශ්‍ය සියලු තොරතුරු නියමිත අවස්ථාවේදී ලබා ගත යුතු අතර අවශ්‍ය කරන තොරතුරු විගණනය වෙත ද නියමිත පරිදි ඉදිරිපත් කල යුතුය.** |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | | |
| (අ) පිටත වටරවුම් මාර්ගය අදියර III, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව III සහ දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව අදියර IV යන ව්‍යාපෘතිවල ගිණුම් හා මෙම ව්‍යාපෘතිවලට අදාලව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අතර වෙනසක් පැවතීම. | 145,485 | 158,658 | 13,173 | ව්‍යාපෘතීන් විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවන් පරීක්ෂා කරමින් පවතින අතර තවදුරටත් පැහැදිලි කිරීම් ව්‍යාපෘති මගින් ලබා ගෙන වෙනසට අදාළ ගැලපුම් ඉදිරියේදී අධිකාරියේ ගිණුම් හා මූල්‍ය වාර්තා වල සිදු කරනු ලැබේ. | නිමකල ව්‍යාපෘතිවලට අදාල වත්කම් ශේෂයන් අධිකාරියේ ශේෂයන් සමඟ සැසඳීම සඳහා කටයුතු කල යුතුය. |

### 1.5.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 හා 14 වැනි වගන්ති සහ 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 07 ඡේදය ප්‍රකාරව එලෙස එකතුකරන ගාස්තු අධිකාරියේ අරමුදලට බැරකල යුතු අතර ගාස්තු අය කරන ජාතික මහා මාර්ග සංවර්ධනයට හා නඩත්තු සඳහා එම අරමුදල් භාවිතා කළ යුතුය. | අධිවේගී මාර්ග වලින් එකතු කරගත් ගාස්තු ආදායම් රු.මිලියන 45,236 ක ආදායමෙන්, රු.මිලියන 15,657ක් යථෝක්ත ගැසට් පත්‍රයේ නියමයන්ට පරිබාහිර වන අධිකාරියේ පොදු වියදම්,වැටුප් ගෙවීම් හා ව්‍යාපෘතිවලට ගෙවීම් සඳහා සහ පොලිස් දෙපාර්තමේන්තුවේ නිළධාරීන් හට පහසුකම් සැපයීම සඳහා වැයකර තිබුණි. | යථෝක්ත ගැසට් පත්‍රය ප්‍රකාරව එකතුකරන ගාස්තු අධිකාරියේ අරමුදලට බැරකල යුතු අතර ගාස්තු අය කරන ජාතික මහා මාර්ග සංවර්ධනයට හා නඩත්තු සඳහා එම අරමුදල් භාවිතා කළ යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු.මිලියන | | | |
| (අ) අධිවේගී මාර්ග ඉදි කිරීම සඳහා වැයකර තිබූ මුදල් අධිකාරියේ වත්කම්වලට ගෙන රාජ්‍ය ප්‍රදාන ලෙස ගෙන තිබීම. | 394,470 | රාජ්‍ය ප්‍රදාන ලෙස සැලකීමට අදාල උපයෝගී ලියවිලි | මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් අංශය සමග සාකච්ඡා කල අතර රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගත යුතු බව දන්වා ඇත. ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ප්‍රදාන ලෙස සැලකීමට අදාලව පිලිගත හැකි උපයෝගී ලියවිලි විගනණය වෙත ඉදිරිපත් කල යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකාරිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් යටතේ වූ රු.මිලියන 29,819 ක වටිනාකම තුල, දකුණු පළාතෙහි සිදුකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් අධිකාරිය වෙත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙතින් රු.මිලියන 1,060 ක් අයවීමට තිබුණි. | ලලිත් ආර් ද සිල්වා කමිටු නිර්දේශයන්ට අනුව අනුමත කල මුදලට අමතර මුදල සඳහා ගිණුම් වල ගැලපීම් සමාලෝචිත වර්ෂයේදී සිදු කිරීමට නොහැකිවූ අතර 2020 වර්ෂයේදී අවශ්‍ය ගැලපුම් සිදු කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | අදාල මුදල් අයකරගැනීම කඩිනම් කිරීම කල යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | රු. | | |
| (අ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත. | | | |
| 78(1) වන වගන්තිය | විලාකටුපොත - ගනේවත්ත - කුඹුක්ගැටේ මාර්ගයේ ඉදිකිරීම් සිදුකර නොතිබූ බෝක්කු සඳහා පනත ප්‍රකාර පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | අංක 12/1 සහ 14/3 දරණ බෝක්කු ඉදිකිරීම අවසන් කර නොතිබූ අතර, විගණන නිලධාරීන්ගේ භෞතික පරීක්ෂාවේදී දෙනු ලැබූ උපදෙස් අනුව පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග | අදාල කටයුතු සම්බන්ධයෙන් පනත ප්‍රකාර පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග අනුගමනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුගමනය කර ඇත. කෙසේ වෙතත් එවැනි අඩුපාඩු ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නා ලෙස අදාල කාර්මික නිලධාරීනිය වෙත ලිඛිතව උපදෙස් ලබා දී ඇත. | |
| (ආ) 1988 අංක 74 දරණ පනතින් සංශෝධිත 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත. | පනතේ විධිවිධාන ප්‍රකාර 2019 ජුනි 30 දිනට නිලධාරින් 506 කගේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ලබා ගෙන නොතිබුණි. | වත්කම් බැරකම් ප්‍රකාශන නියමිත දිනට පෙර සම්පූර්ණ කර පාලන අංශය වෙත ලබා දෙන ලෙස අංක 2020/CL/28 හා 2020.06.12 දිනැති චක්‍රලේඛය මඟින් සියළුම නිලධාරීන් දැනුවත් කර ඇත. | මේ සම්බන්ධව යථෝක්ත පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ. 103 (1) | කුරුණෑගල විධායක ඉංජිනේරු කාර්යාලයට අයත් ස්ථාවර වත්කම්, 2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ සම්බන්ධව කරුණු සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර එම වාර්තාව නොපමාව ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත. | අධිකාරියේ සියලුම වත්කම් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) මු.රෙ. 104 (3) (4) | වයඹ පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ වාහන 05 ක සිදු වී තිබූ අනතුරු වලට අදාල පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කාර්යාලය විසින් වාහන අනතුරු සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් හා මූලික වාර්තාවක් ඉදිරිපත් කර ඇත. මින් ඉදිරියට වාහන අනතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු දැනුම් දී ඇත. | වාහන අනතුරු සම්බන්ධව මු.රෙ. 104 (3) (4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. |
| (iii) මු.රෙ. 395 (අ) (ඇ) | මාර්ග සංවර්ධන අධිකාරියේ බැංකු ජංගම ගිණුම් 107 ක් පවත්වාගෙන ගොස් තිබූ නමුත් ඒවාට අදාල බැංකු සැසඳුම් ප්‍රමාද වී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | සියලු ජංගම ගිණුම්වලට අදාල බැංකු සැසඳුම් නියමිත දින හෝ ඊට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. |
| (iv) මු.රෙ .570 | මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම් කාලය ඉක්මවූ රඳවා ගත් තැන්පතු රු.මිලියන 1,010.17 ක්, කාර්යභාරය නිමවා තිබුණු සේවාදායක තැන්පතු රු. මිලියන 1,190.24 ක් හා වෙනත් තැන්පතු රු.මිලියන 361.22 ක් අධිකාරියේ ආදායමට ගෙන නොතිබූ අතර තවත් රු.මිලියන 291.41 ක් වු රඳවාගත් තැන්පතු ද ආදායමට ගතහැකි ව තිබුණද එසේ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ රඳවාගත් මුදල් පිළිබඳ පුළුල් විශ්ලේෂණයකින් පසු එම මුදල් අධිකාරියේ අදායමට ගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින අතර, ඒ පිළිබඳව සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් / ප්‍රධාන ඉංජිනේරුවරුන් දැනුවත් කරන ලදී. | වගකීම් කාලය ඉක්මවූ රඳවා ගත් තැන්පතු, කාර්යභාරය නිමවූ සේවාදායක තැන්පතු මු.රෙ .570 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කිරීම. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය,

| | | | |
|---|---|---|---|
| (i) VI වන පරිච්ඡේදයේ 04 වන වගන්තිය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහයේ 88 වගන්තිය | පෞද්ගලික ලිපි ගොනු විධිමත්ව අදාල පරිපාටියට අනුව නඩත්තු කර නොතිබුණි. | නව තනතුරු වලට සේවකයන් බඳවා ගන්නා අවස්ථාවේ ඔවුන්ගේ පුද්ගලික ලිපිගොනු සකස් කිරිම සඳහා නව ලිපිගොනු භාවිතා කරන අතර වසර ගණනාවක් පරිහරණය කර ඇති පැරණි පුද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීමට අවස්ථානුකූලව දැනටමත් පියවර ගෙන ඇත. | පෞද්ගලික ලිපි ගොනු විධිමත්ව නඩත්තු කල යුතුය. |
| (ii) II වැනි පරිච්ඡේදයේ 05 වන හා 06 වන වගන්ති | ආයතන සංග්‍රහයේ 6.1.1, 6.13, 6.1.4 හා 6.1.6 සඳහන් කොන්දේසි සපුරා නොතිබුණ මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු සේවයේ 10 දෙනෙකුට සහ අධිකාරියේ පරිපාලන සේවයේ 03 දෙනෙකුට උසස් වීම් ලබා දී තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 1450/2013 මගින් වැටුප් හා සේවක මණ්ඩල කොමිසමේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව නව බඳවාගැනීමේ පරිපාටි අනුමැතිය ලබා ගන්නා තෙක් 2005 බඳවාගැනීමේ පරිපාටිය යටතේ උසස්වීම් ලබා දීමට අනුමැතිය ලබා දී ඇත. <br>තවද 842/2005 දරන අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව 3:2 අනුපාතය යටතේ එක් ශ්‍රේණියක දීර්ඝකාලයක් රඳවාගැනීමකින් තොරව (Stagnate) උසස්වීම් ලබා දීමට ලද අනුමැතිය මත අනුමත කාර්යමණ්ඩල දර්ශකය ඉක්මවමින් උසස්වීම් ලබා දී ඇත. | පත් කිරීමේ දී උසස් කිරීමේ දී ආයතන සංග්‍රහයේ දැක්වෙන නිශ්චිත විධිවිධාන අනුගමනය කල යුතුය |

(ඉ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| (i) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 හා 2017 අයවැය යෝජනා අංක 373 | බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ හා සියළුම වැඩ ඒකකවල චක්‍රලේඛය ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට ගෙන නොතිබුණි. | බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ දැනටමත් ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකර ඇති අතර වැඩ ඒකක සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතය සම්බන්ධයෙන් යථෝක්ත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| - 1 වගන්තිය | වගන්තිය ප්‍රකාරව අධිකාරිය මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණ අතර කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හෝ කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමේ ක්‍රමවේදයක් ඉදිරියේදී සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට, කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමට හා කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කල යුතුය. |
| - 5 වගන්තිය | වගන්තිය ප්‍රකාර මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ඉදිරියේදී සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |
| (ඊ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | | |
| (i) අංක PED/12 හා 2003 ජූනි 02 දරණ චක්‍රලේඛයේ 9.12 වගන්තිය | සුබසාධන කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත් කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවා සැපයීම සඳහා එකී අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ පාලන වෙත උපදෙස් ලබා දී ඇත. | සුබසාධන කටයුතු සඳහා අදාල ච ලේඛය ප්‍රකාරව අනුමැතිය ලබාගත යුතුව තිබුණි. |
| (ii) ඉහත චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය | මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර අනුමත කරවා ගෙන නොතිබුණි. | දැනට පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති උපදේශකවරියක් පත්කර ඇති අතර කාර්යය මණ්ඩල දර්ශකය සම්බන්ධ කෙටුම්පත් වාර්තාව කළමණාකාරීත්වය වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත. එය අනුමත වූ වහාම බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | තවදුරටත් කල් ප්‍රමාද නොකර බඳවාගැනීමේ පටිපාටියක් පිළියෙල කර අනුමත කරවා ගැනීමට කටයුතු කල යුතුය. |
| (උ) 2019 මාර්තු 15 දිනැති අංක 01/2019, දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2.3.3(a),(b) වගන්ති, | සේවකයන් ව්‍යාපෘති වෙත මුදා හැරිය හැකි කාලය වර්ෂ 05 නොඉක්ම විය යුතු වුවත් එසේ මුදාහැර තිබූ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයින් 477 දෙනෙකුගෙන් 306 ක් ම ව්‍යාපෘති වලට මුදා හැර වර්ෂ 05 ක | දැනට වාර්ෂික ස්ථාන මාරුවීම් වලට අමතරව අනිවාර්යය මාරු කිරීම් සිදු කිරීමට කළමණාකාරීත්වය තීරණය කර ඇත. ඒ අනුව පසුගිය කාලය තුලදී සමහර ප්‍රාදේශීය කාර්යාලවල අනිවාර්යය මාරු කිරීම් ක්‍රියාත්මක | සේවකයන් ව්‍යාපෘති වෙත මුදා හැරීමේ දී සැමට සාධාරණ ඉඩ ප්‍රස්ථා සැලසෙන පරිදි කටයුතු කල යුතු අතර චක්‍රලේඛයන්ට අනුගත විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලයක් ඉක්මවා තිබුණි. | කිරීම සිදුකර ඇත. ව්‍යාපෘතිවල සේවයේ නියුතු නිලධාරීන්ටද මෙම අනිවාර්යය මාරු කිරීම් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | |
| (ඍ) මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලන චක්‍රලේඛ | | | |
| (i) 2019 ඔක්තෝබර් 07 දිනැති අංක 2019/CL/68 දරන චක්‍රලේඛය | ජනප්‍රිය සේවා ස්ථානවල රාජකාරි කරන නිලධාරීන් කාලීනව හා විධිමත් පරිදි ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | එකම සේවා ස්ථානයක වසර 05 වඩා සේවය කර ඇති සියලු සේවකයන් වාර්ෂික ස්ථාන මාරු වීම් ඉල්ලුම් කලයුතු බව දන්වා 2021 වසර වෙනුවෙන් වාර්ෂික ස්ථාන මාරු වීමේ චක්‍රලේඛය නිකුත් කර ඇති අතර මේ වන විට ඒ සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතී. | මේ සම්බන්ධව අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) 01 ජුනි 2018 දිනැති අංක RDA/AO-06/MA27දරන චක්‍රලේඛය | අධිකාරියෙහි මාර්ග නඩත්තු කම්කරුවන් 395 දෙනෙකුගේ අතිරික්තයක් තිබියදී 2019 වර්ෂය තුළ කුලී පදනම මත අතිරේකව කම්කරුවන් පිටතින් ලබා ගැනීම වෙනුවෙන් රු.මිලියන 482.93 ක් වැයකර තිබුණි. | වාර්ෂික ස්ථාන මාරුකිරීම් හා අනිවාර්ය මාරු කිරීම් යටතේ මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අනුමත සේවක සංඛ්‍යාව මත බඳවා ගැනීම් සිදුකිරීමට සහ අරමුදල් මනාව කලමණාකරණය කිරීමට. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 145,373,392,899 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 21,455,896,525 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 123,917,496,374ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හුවමාරු නොවන ගනුදෙනු වලින් පැනනැගි රාජ්‍ය ප්‍රදාන අදායම් සේ සලකා ගිණුම් තැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

-----------------------------------------------------------------

| අයිතමය | 2019 වර්ෂය | 2018 වර්ෂය | 2018 සාපේක්ෂව ප්‍රතිශතක වෙනස |
|---|---|---|---|
| | රු.මිලියන | රු. මිලියන | |
| රාජ්‍ය ප්‍රදාන | **169,117** | **26,136** | **547** |
| පොළී ආදායම | **1,067** | **776** | **37.5** |
| සංවර්ධන හා නඩත්තු වියදම් | **15,142** | **8,902** | **70** |
| මූල්‍ය වියදම් | **15,866** | **17,362** | **(09)** |

නිමකරන ලද මාර්ග ව්‍යාපෘති අධිකාරියට පැවරීමේදී එලෙස පවරන ලද වත්කම් වලට සමාන රාජ්‍ය ප්‍රධාන ආදායම් ලෙස හඳුනා ගැනීම නිසා රාජ්‍ය ප්‍රධාන ඉතා සැලකිය යුතු ප්‍රතිශතයකින් ඉහළ ගොස් ඇති අතර, අධිවේගී මාර්ග පද්ධතිය පුළුල් වීම නිසා ආදයම් වැඩි වීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වැඩි වී පොලී අදායම ඉහළ ගොස් තිබුණි.
අධිකාරිය ක්‍රියාත්මක කරන ලද රන් මාවත් ව්‍යාපෘතයේ මාර්ග ඉදිකිරීම් සඳහා ගෙවීම් වියදම් වශයෙන් ලියා හැරීම හේතුවෙන් සංවර්ධන හා නඩත්තු වියදම් ඉහළ ගොස් තිබුණි.
අධිකාරියේ ණය ගෙවීම් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය වියදම් පෙර වසරට සාපේක්ෂව අඩු වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

| | 2019 | 2018 |
|---|---|---|
| ජංගම අනුපාතය | 2:1.69 | 2: 1.54 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 1:1.67 | 1: 1.52 |

ජංගම අනුපාතය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී ජංගම අනුපාතයේ කිසියම් ධනාත්මක වැඩිවීමක් නිරූපනය වන අතර ක්ෂණික වත්කම් අනුපාතය ද අපේක්ෂිත අවම මට්ටම ළඟා වී තිබෙන අතර එයද පෙර වර්ෂ සමඟ වර්ධනයක් පෙන්නුම් කෙරේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු නොමැති තනතුරු සඳහා උසස් කිරීමෙන් හා පත්වීම පෙරදාතම් කිරීමෙන් කාර්ය මණ්ඩලය වෙත සිදුකර තිබූ වැඩිපුර ගෙවීම් මත සිදුව තිබූ අලාභය රු. මිලියන 3.9 ක් වී තිබුණි. | ඉදිරි පත්වීම් සිදු කිරීමේදී අනුමත වැටුප් කේතයන්ට අනුව උසස්වීම් හා වැටුප් ලබාදීම සිදු කිරීමටද අධිකාරියට මින් ඉදිරියට මූල්‍යමය පාඩුවක් නොවන ආකාරයට කටයුතු කරන ලෙසද අදාළ අංශ දැනුවත් කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමතකරන ලද වැටුප් පරිමාණයන් පමණක් ගෙවීම, පුරප්පාඩු නොමැති තනතුරු සඳහා උසස් වීම් ලබාදීමෙන් හා පෙරදාතම කිරීමෙන් වැලකීම. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත<br>(i) 7(3) වගන්තිය<br>මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් සභාව, අදාළ පළාත් පාලන ආයතන සහ වෙනත් නියෝජිත ආයතන විසින් භාර ගැනීමට ඇති දිස්ත්‍රික්කයේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති නිශ්චිතව දක්වන්නා වූ “ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්” සකස් කර නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය මගින් මේ පිළිබඳව කටයුතු කරමින් පවතී. | “ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධනය සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක්” සකස් කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 6(1) වගන්තිය<br>උසස් මාර්ග පද්ධති ප්‍රතිපත්තියක් සකස්කිරීමට, ක්‍රමෝපාය සංවර්ධනය කිරීමට, මාර්ග පිළිබඳ පර්යේෂණ හා මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් පියවර ගැනීමට, අධිකාරිය විසින් යොමු කරනු ලබන මාර්ග සැලසුම් පිළිබඳ කටයුතු කිරීමට අමාත්‍යවරයා වෙත උපදෙස් ලබා දීම සඳහා පිහිටවිය යුතු “මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව” පිහිටුවා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය මගින් මේ පිළිබඳව කටයුතු කරමින් පවතී. | “මාර්ග පද්ධති සංවර්ධන උපදේශක සභාව” පිහිටුවීම සඳහා පියවර ගත යුතුය. |
| (iii) | 7(1) වගන්තිය<br>සෑම දිස්ත්‍රික්කයක් සඳහාම ඒකාබද්ධ මාර්ග පද්ධති සංවර්ධන සහ නඩත්තුව සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම, මාර්ග සංවර්ධන සහ නඩත්තු කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය, මාර්ග සංවර්ධන ව්‍යාපෘති භාර දීම විධිමත් කිරීම හා ව්‍යාපෘති භාරගැනීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට නිර්දේශ කිරීම සඳහා පිහිටවිය යුතු “දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු” පිහිටුවා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය මගින් මේ පිළිබඳව කටයුතු කරමින් පවතී. | “දිස්ත්‍රික් මාර්ග පද්ධති සංවර්ධන සම්බන්ධීකරණ කමිටු” පිහිටුවීමට පියවර ගැනීම. |
| (ආ) | අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය හෝ ලබා නොගෙන මාර්ග රක්ෂිත විවිධ ආර්ථික කටයුතු සඳහා බාහිර පාර්ශව වෙත බදු දී තිබුණි. එම ඉඩම් බදුකරුවන් විසින් ගිවිසුම්ගත කාර්යයන්ගෙන් පරිබාහිර කටයුතු සඳහා ඉඩම් භාවිතා කර තිබුණද අධිකාරිය ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණිඑසේම . මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අක්කර 11 රූඩ් 02 පර්චස් 38.3 ක් වූ රු.මිලියන 123 ක් වටිනා අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි ඉඩම වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජර්මානු කාර්මික විද්‍යාලය විසින් භුක්ති විඳින අතර ඉතිරි බිම් කොටස් වල අනවසර පුද්ගලයින් පදිංචිව සිටින බව වාර්තා කර තිබුණි. | අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි ඉඩම බේස්ලයින් මාර්ග ව්‍යාපෘතියේ අවතැන් වූවන් පදිංචි කිරීම සඳහා මිලදී ගෙන ඇති අතර මෙතෙක් එම ව්‍යාපෘතියේ වැඩ අවසන්ව නොමැත. ඉදිරියේදී ඇති වන අනශ්‍යතාවයන් මත මිලදී ගත් අරමුණ වෙනුවෙන් ඉඩම යෙදවීමට බලාපොරොත්තු වේ. | අධිකාරි සම්පත් අපේක්ෂිත අරමුණු කෙරෙහිම භාවිත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | අධිකාරිය විසින් මිලදී ගන්නා වත්කම් සම්බන්ධයෙන් ඇණවුම නිකුත් කරන අවස්ථාවේ සිට එම වත්කම් ඉවත්කරන අවස්ථාව දක්වාත්, ගොඩනගන වත්කම් සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ වල සිට ප්‍රාග්ධනිත කිරීම දක්වාත් අවශ්‍ය කරන නියාමනයන් සිදුකිරීම පිණිස වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ විගණන ඡේදය හා සම්පූර්ණයෙන් එකඟ විය නොහැක.<br><br>එසේ වුවද වත්කම් කළමණාකරනය පිළිබදව අංග සම්පූර්ණ පද්ධතියක් ස්ථාපිත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බිල්පත් සහතික කිරීමට අසාමාන්‍ය කාලයක් ගතවීම හා සන්නිවේදන දුර්වලතා හේතුවෙන් අධිකාරියේ ගිණුම් පරිපාලිත සමාගම්වල ගිණුම් ශේෂයන් අතර ප්‍රමාණාත්මක නොසැසඳීම් පැවතියද එම තත්ත්වය | ඇතැම් පරිපාලිත සමාගම් හා මාර්ග සංවර්ධන අධිකාරිය සමග සැසඳුම් සිදු කර වෙනස හදුනාගෙන ඇත. මගනැගුම | අධිකාරියේ ගිණුම් පරිපාලිත සමාගම්වල ගිණුම් ශේෂයන් අඛණ්ඩව සැසඳීමට |

| | | |
|---|---|---|
| වෙනස් කරගැනීම සඳහා කළමනාකරණය මේ දක්වා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මාර්ග ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ සමාගම සමග සැසඳීම් කටයුතු සිදුකෙරෙමින් පවතී.<br><br>තවද දෙපාර්ෂවය විසින් සෑම මසකම ගිණුම් ගත කරනු ලබන ගනුදෙනු මාසිකව සන්සන්දනය කිරීමටද උපදෙස් ලබා දී ඇත. | කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ පළමු අදියරේ ගිවිසුම් අවලංගු වීම නිසා අවස්ථා 06 ක දී ව්‍යාපෘතිය ප්‍රමාදවී තිබූ අතර ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අධිවේගී මාර්ගයේ 04 කොටසේ ඉදිකිරීම් සිදු කළ සමාගමේ හෙළිදරව් නොකළ වියදම් පියවීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ඉදිකිරීම් සමාගමකට රු.මිලියන 158,386 කට භාර දී තිබුණි. ව්‍යාපෘතිය සඳහා අරමුදල් ලැබීම පිළිබඳව නිශ්චිතතාවයක් නොතිබීම සහ දුර්වල මූල්‍ය සැලසුම්කරණය හේතුවෙන් ව්‍යාපෘතියේ මෙහෙයුම් ඒකකය සඳහා සහ රු.මිලියන 94.39 ක්ද උපෙද්ශන සේවා සඳහා රු.මිලියන 392.64 ක්ද නිශ්කාර්යව වැයකර තිබුණි. එමෙන්ම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ භෞතික ප්‍රගතිය උපදේශක විසින් ඇගයීමට ලක් කිරීමකින් තොරව රු. මිලියන 449.02 ක් ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු තමාගේ වියදමින් ලබා ගත යුතු කාර්යසාධන ඇප සුරක්ෂණ වැඩ ප්‍රමාණන පත්‍රයේ වැඩ අයිතමයක් ලෙස දක්වා කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ යුතු ජ්‍යාමිතික සැලසුම් සහ අනෙකුත් සියළු සැලසුම් වැඩ සඳහා රු.මිලියන 83.14 ක් වැඩ ප්‍රමාණ පත්‍රයට එකතු කර කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියක් නම්, අරමුදල් ගිවිසුම අත්සන් කිරීමට පෙර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කළ හැකිය. මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවන ලද්දේ කැබිනට් අනුමැතියෙන් මෙන්ම ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතියෙන් පසුවය.<br><br>ව්‍යාපෘතිය සඳහා අරමුදල් වෙන් කිරීම සහතික කිරීම මහාභාණ්ඩාගාරයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුවේ වගකීම වේ. | ව්‍යාපෘති මනාව සැලසුම් කිරීම හා අරමුදල් ලැබීම පිළිබඳ නිශ්චිත තාවයක් ඇතිකර ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘති ආරම්භ කල යුතුය.තවද සෑම විටම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගේ භෞතික ප්‍රගතිය උපදේශක විසින් ඇගයීමට ලක්කිරීමට පියවර කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මධ්‍යම අධිවේගී මාර්ගයේ තුන්වන කොටස සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් රු.මිලියන 3,469.89 ක් ගෙවා තිබුණ ද කිසිදු ඉඩමක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 ඡේදය අනුව ලියාපදිංචි කර නොතිබුණි. උපදේශන සමාගම විසින් ඉල්ලීම් කර තිබූ රු.මිලියන 161 ක විචලන නියෝගවල වලංගුතාවය සැළකිල්ලට නොගෙන කෙරී ගෙන යන වැඩවලට එකතු කර ගෙවීම් කර තිබුණි. එමෙන්ම ව්‍යාපෘතියේ අරමුදල් ලැබීම් පිළිබඳව නිශ්චිතතාවයක් නොමැතිව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව රු.මිලියන 663.93 ක් ව්‍යාපෘති මෙහෙයුම් ඒකක සඳහා වැයකර තිබුණි. | ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියේදී ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී වශයෙන් කටයුතු කරනු ලබන්නේ අදාල ප්‍රාදේශීය ලේකම් විසින් වන අතර 2019වර්ෂය අවසාන වන විට මධ්‍යම අජිවේගී මාර්ග ව්‍යාපෘතියේ ඉදිකිරීම් කඩිනමින් ආරම්භ කිරීම අරමුණු කරගෙන ලාර්ක් කමිටු පැවැත්වීමට හා වන්දි ගෙවීම් සඳහා එවකට මූලිකත්වය ලබා දී තිබුණි . අද වන විට එම පොලී ගෙවා අවසන් කැබලි ගණන 181න් කැබලි 48ක පැවරුම් ක්‍රියාවලිය අවසන් කර ඇති අතර ඉදිරියේදී පොලී ගෙවීම් කර ඇති සිටලුම කැබලි සඳහා 44 වගන්තිය යටතේ පැවැරුම් ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට ව්‍යාපෘතිය ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘතියේ අරමුදල් ලැබීම් පිළිබඳව නිශ්චිතතාවයක් සහිතව ව්‍යාපෘති දියත් කිරීම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස්වලට අනුගතව කටයුතු කිරීමට, පියවර ගත යුතුය. |
| (ඇ) | මධ්‍යම අධිවේගී මාර්ගයේ 04 වන කොටස ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සම්පූර්ණ අධිවේගී මාර්ගය සඳහාම ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීම වෙනුවෙන් රු.මිලියන 2,193 ක් වැයකර තිබූ අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණ ද ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයේ කටයුතු සඳහා රු.මිලියන 269.1 ක් වැය කර තිබුණි. ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා විවිධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දිරිදීමනා රු.මිලියන 5.1 ක් ගෙවා තිබුණ ද ඉඩම් අත්පත් කර ගැනීමේ පනෙත් 9 වන වගන්ති ප්‍රකාර ඉඩම් කැබලි 1,667 සඳහා පරීක්ෂණයන් සිදුකර 10 (1) වන වගන්ති ප්‍රකාර නිවේදන නිකුත් කර තිබුනේ ඉඩම් කැබලි 573 ක් සඳහා පමණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවල ප්‍රතිපාදනවලට පටහැනිව නිලධාරීන් 03 දෙනෙකු බඳවා ගෙන ඒ වෙනුවෙන් වැටුප් ලෙස රු.මිලියන 3.07 ක් ගෙවා තිබුණි. එමෙන්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවා ගෙන තිබූ උපදේශකයෙකුට රු.මිලියන 0.9 ක් ගෙවා තිබුණි. | 2012 සිට 2015 දක්වා උතුරු අධිවේගී මාර්ගය සඳහා කරනු ලැබූ ශක්‍යතා අධ්‍යනයට වැයවුනු පිරිවැය දරණ ලද්දේ උතුරු අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මගින් වන අතර එම ව්‍යාපෘතිය 2015 වසරේදී මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ලෙස කළමණාකරන ඒකක 4ක් වශයෙන් වෙන් කරන ලදී.<br><br>2016.09.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී චීනයේ ගෂෝබා ජාත්‍යන්තර ඉංජිනේරු සමූහ සමාගම වෙතින් තාක්ෂණික සහ මිල යෝජනා ලබා ගෙන ඇගයීමට ලක් කරන ලෙස නිර්දේශ කරනු ලැබින . ඒ අනුව 2016 ජූලි මස පිහිටුවනු ලැබූ ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.<br><br>ඉඩම් අත්කරගැනීමේ ක්‍රියාවලිය අත්හිටුවීමකින් තොරව ඉදිරියට ගෙන යාම සඳහා ව්‍යාපෘති කළමණාකරන ඒකකය කටයුතු කළේය. | ව්‍යාපෘති සම්බන්ධයෙන් නිශ්කාර්ය වියදම් ඇති නොවන පරිදි ව්‍යාපෘති සැලසුම් කිරීම හා ඉඩම් අත්පත්කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම හා වියදම් මනාව කළමණාකරණය කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අවශ්‍යතාවය අනුව අරපිරිමැසුම්දායී ලෙස කටයුතු කළ හැකි විකල්ප ක්‍රම තිබියදී පිළිවෙලින් රු.මිලියන 23.8 ක්, සහ රු.මිලියන 25 බැගින් වූ අධි සුඛෝපභෝගී වාහන මිලදී ගැනීම සඳහා කටයුතු කර තිබුණි. | මුදල් අමාත්‍යාංශය අයවැය චක්‍රලේඛ අංක 4/2019 හා මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛන අංක 7/2019 දරණ ලිපි වලට අනුව මේ වන විටත් ව්‍යාපෘති කාර්යාල මගින් වාහන මිලදී ගැනීම් නවතා ඇත. | ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී අවශ්‍යතාවය අනුව අරපිරිමැසුම්දායී ලෙස කටයුතු කළ යුතුය. |
| (ආ) | මධ්‍යම අධිවේගී මාර්ග දෙවන කොටස මගින් අත්පත් කරගැනීමට යෝජිත කිසිදු ඉඩමක් ඉඩම් පනතේ 44 උප වගන්තිය යටතේ ලියාපදිංචි කර නොතිබුණ ද ඒ සඳහා රු.මිලියන 16.44 ක් දිරිදීමනා ලෙස නිළධාරීන්ට ගෙවා තිබුණි. එමෙන්ම ඉදිකිරීම් උපදේශන සේවාව සඳහා අවශ්‍ය ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන්වන් 48 ක් හා දේශීය ඉංජිනේරුවන්වන් හා විශේෂඥයින් 156 ක් සේවයේ යොදවා නොතිබුණද ගිවිසුම මගින් එකඟ නොවූ කාර්මික නිලධාරීන් 12 ක් හා ඉංජිනේරුවෙක් සඳහා රු.මිලියන 46 ක් ගෙවා තිබුණි. එමෙන්ම උපදේශක විසින් අමතර පිරිවැයක් නොමැතිව අධීක්ෂණ කටයුතු සිදු කළ යුතු වුවද උපදේශන කාර්ය මණ්ඩලයේ අතිකාල දීමනා රු.මිලියන 74.24 ක් කොන්ත්‍රාත්කරු විසින් ගෙවා තිබූ බැවින් උපදේශකගේ ස්වාධීනත්වය ගැටළු සහගත තත්ත්වයක පැවතුණි. එමෙන්ම ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ නිලධාරී සඳහා කොන්ත්‍රාත්කරුගෙන් වැටුප් ලබන නිලධාරියෙක් යොදවා ඒ සඳහා රු.මිලියන 2.16 ක් කොන්ත්‍රාත්කරු විසින් ගෙවා තිබීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි. | ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලියේදී ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී වශයෙන් කටයුතු කරනු ලබන්නේ අදාල ප්‍රාදේශීය ලේකම් විසිනි.<br><br>අද වන විට එම පොලී ගෙවා අවසන් කැබලි ගණන 181න් කැබලි 48ක පැවරුම් ක්‍රියාවලිය අවසන් කර ඇති අතර ඉදිරියේදී පොලී ගෙවීම් කර ඇති සිටලුම කැබලි සඳහා 44වගන්තිය යටතේ පැවරුම් ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට ව්‍යාපෘතිය ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරනු ලැබේ. | අත්පත්කර ගත් ඉඩම් 44 උප වගන්තිය යටතේ ලියාපදිංචිය කඩිනම් කිරීමට.<br>ඉදිකිරීම් උපදේශන සේවාව සඳහා ගිවිසුම මගින් එකඟ නොවූ ගෙවීම් කිරීමෙන් වැලකීමට.උපදේශකගේ ස්වාධීනතාව පවත්වාගෙන යාම සඳහා කටයුතු කළ යුතුය. |

### 3.5 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 නොවැම්බර් 30 දිනට අධිකාරියේ පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාල 09 සහ අක්කරෙයිපත්තු කාර්යාලය වෙනුවෙන් පැවති බැංකු ගිණුම් 31 ට අදාළව රු.මිලියන 309 ක මුදල් ශේෂව පැවති අතර, එදිනට ඉදිරිපත් නොවූ චෙක්පත්වල මුළු එකතුව රු.මිලියන 184 ක් වූයෙන් රු.මිලියන 125 ක නිශ්කාර්ය මුදල් ශේෂයක් ජංගම ගිණුම්වල රඳවා තිබූ බව නිරීක්ෂණය විය. | ඍජු කම්කරු වැටුප් slipක්‍රමයට අදාල සේවකයාගේ බැංකු ගිණුම් වෙත යැවීම, අදාල සැපයුම්කරුවන්ගේ සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ගිණුම් වලට ඔවුනට අදාල ගෙවීම් ඍජුවම බැංකු ගිණුම් වෙත යැවීම, මාර්ග සංවර්ධන අධිකාරියේ සේවා දායක තැන්පතු සහ පොදු කාර්යය වියදම් යන ක්‍රියාකාරී ජංගම ගිණුම්හි දෛනිකව පවතින අතිරික්ත මුදල් ආයෝජනය (overnight REPO) කිරීමේ හැකියාව හා ක්‍රමවේදය ගැන | නිශ්කාර්ය මුදල් ශේෂ ජංගම ගිණුම්වල රඳවා ගැනීමෙන් තොරව මනාව කළමනාකරණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විපරම් කිරීමට, ජංගම ගිණුම් පවත්වාගෙන යන ලංකා බැංකුව සමග සාකච්ඡා කර ආයෝජනය කිරීමට ඉදිරියේදි කටයුතු කරනු ලබන බව දන්වමි. | |

**3.6 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |
| (i) 2.4.1 ඡේදය<br>සෑම ලිත් වර්ෂයක් ආරම්භයේදීම එම වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටු නිළධාරින් පත්කළ යුතු වුවත් 2019 වර්ෂය සඳහා වයඹ පළාත් අධ්‍යක්ෂ කාර්යාලයට අදාළ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ නිළධාරින් පත්කිරිමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂය සඳහා 'ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු' පත් කර නොමැති අතර එම වර්ෂයට අදාල ප්‍රසම්පාදන කමිටුවේ කාර්ය භාරය එම වර්ෂයට පෙර වර්ෂයේ පත් කරන ලද කමිටුව විසින් සිදු කර ඇති බව දන්වමි. 2020 වර්ෂය සඳහා නියමිත පරිදි අදාළ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ නිලධාරීන් පත් කර ඇත. | සෑම ලිත් වර්ෂයක් ආරම්භයේදීම එම වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටු නිළධාරින් පත්කළ යුතුය. |
| (ii) 4.2.1 ඡේදය<br>අධිකාරිය විසින් 2019 වර්ෂය ද ඇතුලත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2019 සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොමැති අතර ඉදිරි වර්ෂ 3ක් සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් සැලැස්මක් පිළියෙල කිරීමට පියවර ගන්නා ලදී. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) 5.3.11(අ) ඡේදය<br>සියලුම ලංසුකරුවන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ලංසු සුරක්ෂණයන් ඉදිරිපත් කලයුතු වුව ද වයඹ පළාත් අධ්‍යක්ෂ කාර්යාලය මගින් සිදු කරනු ලැබු භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන සඳහා ලංසු සුරක්ෂණයන් ලබාගෙන නොතිබුණි<br>. | ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා අදාල (Bid Security) ලබාගෙන අදාල ලංසු ආකෘති පත්‍ර ලබාදීමට කටයුතු කර ඇති අතර ඉදිරි ලංසු කැඳවීමේදී භාණ්ඩ හා භාණ්ඩ හා සේවා සඳහාද ලංසු ඇපකර ලබා ගැනීමට පියවර ගන්නා ලදී. | භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදන සඳහා ලංසු සුරක්ෂණයන් නියමිත ආකෘති පත්‍රය අනුව ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (iv) ඡේදය 8.9.1<br>කුලී පදනම මත වාහන ලබා ගැනීමට අදාළව මාර්ග සංවර්ධන අධිකාරිය සහ සැපයුම්කාර ආයතනය සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. | ඉදිරියේදී කුලී පදනම මත වාහන ලබා ගැනීම අවශ්‍ය වුවහොත් කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට කටයුතු යොදනු ලැබේ. | කුලී පදනම මත වාහන ලබා ගැනීමට අදාළව මාර්ග සංවර්ධන අධිකාරිය සහ සැපයුම්කාර ආයතනය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. |

### 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 07 කින් අයවිය යුතු රු.මිලියන 48.56 ක් සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයන් ලබා ගෙන නොතිබීමක් හෝ අවශ්‍යතාවය පරිදි දීර්ඝ කරගැනීමක් සිදුකර නොතිබුණි. එමෙන්ම අයවිය යුතු ශේෂය රු.මිලියන 64.96 ක් වූ කොන්ත්‍රාත් 25 ක වැඩ අවසන් කිරීමේ ඉලක්කගත දිනයන් අවසන්ව තිබූ අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයන්ගේ වලංගු කාලයද ඉක්මවා තිබුණි. | මෙහි සඳහන් කර ඇති විවිධ හේතූන් යටතේ ප්‍රාරම්භක අත්තිකාරම් අය නොවී පැවැතීම වර්තමානයේදී සිදු නොවන අතර ඒවා නියමිත ආකාරයට බිල්පත් වලින් අයකර ගැනීම හෝ ඇපසුරක්ෂණ මුදල් කර එමගින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සුරක්ෂණයන් නිසි පරිදි ලබා ගැනීමට, අවශ්‍යතාවය පරිදි එවා නියමිත පරිදි දීර්ඝ කරගැනීමට. කටයුතු කළ යුතුය. |

### 3.8 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය විසින් රු.මිලියන 2,664.05 ක පිරිවැයක් දරා ඉදිකර තිබූ වර්ග අඩි 252,055 ක් වූ මාර්ග සංවර්ධන අධිකාරියේ මුලස්ථාන ගොඩනැගිල්ලෙන් සියයට 28.7 ක් වූ වර්ග අඩි 72,400 ක් මාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය විසින් භාවිතා කරන නමුත් ඒ සඳහා බදු කුලියක් අයකර නොතිබුණිඑසේ වුවත් මුලස්ථාන . ගොඩනැගිල්ලේ ඉඩකඩ නොමැති වීම හේතුවෙන් සෙත්සිරිපාය ගොඩනැගිල්ලෙන් වර්ග අඩි 12,272 ක් මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යාල පවත්වාගෙන යෑම වෙනුවෙන් භාවිතා කර ඒ සඳහා 2019 වර්ෂයේ දී රු.මිලියන 27.27ක කුලියක් අධිකාරියට ගෙවීමට සිදු වී තිබුණි. | 2021 වාර්ෂික ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා ගැනීමට අවශ්‍ය කටයුතු කරන අතර ලැබෙන ප්‍රතිපාදන මත ගොඩනැගිලි කුලී ගෙවීමට අවශ්‍ය කටයුතු කරන බව මහා මාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන මුල්‍ය නිලධාරී විසින් අප වෙත දන්වා එවා ඇත. සෙත්සිරිපායේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිලි තුල මේ වන විට වර්ග අඩි 12272න් වර්ග අඩි 5272ක ප්‍රමාණයක් එම පරිශ්‍රයෙන් ඉවත් කරගෙන ඇත. | වත්කම හා බැදි අවදානම හා ප්‍රතිලාභය ලබන පාර්ශ්වය සැලකිල්ලට ගෙන වත්කම හඳුනාගැනීමට ක්‍රියාකල යුතුය.වත්කම හා ආනුශංගිකව බැදි වියදම් ප්‍රතිපූර්ණය කරවා ගැනීමට ක්‍රියාකල යුතුය. |

### 3.9 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන මාර්ග ඉදිකිරීම් සහ නඩත්තු ක්ෂේත්‍රයට ඍජුව බලපෑමක් ඇති කරන ඉංජිනේරු සේවයේ සහ තාක්ෂණික සේවයේ පුරප්පාඩු 221 ක් පැවතුණි. තවද, එදිනට ඉංජිනේරු සේවකයන් 36ක, කළමනාකරණ සහකාර සේවකයින් 420ක, සහායක කාර්ය මණ්ඩලයේ 402 ක සහ නඩත්තු කම්කරුවන් 395 දෙනෙකුගේ අතිරික්තයක් ද පැවතුනි. කෙසේ නමුත් 2019 වර්ෂයේ මුල්‍ය | විගණන නිරීක්ෂණ හා එකඟ වේ.<br><br>අධිකාරියට අවශ්‍ය ප්‍රශස්ත කාර්යය මණ්ඩලය ගණනය කිරීම සඳහා පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති උපදේශකවරියක් පත්කර ඇති අතර කාර්යය මණ්ඩල දර්ශකය සම්බන්ධ කෙටුම්පත් වාර්තාව කළමණාකාරීත්වය වෙත මේ වන විට ඉදිරිපත් කර ඇත .එමගින් ප්‍රශස්ථ සේවක සංඛ්‍යාවක් තීරණය | අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන මාර්ග ඉදිකිරීම් සහ නඩත්තු ක්ෂේත්‍රයට ඍජුව බලපෑමක් ඇති කරන ඉංජිනේරු සේවයේ සහ තාක්ෂණික සේවයේ පුරප්පාඩු පිරවීමට සහ අනුමත සේවක සංඛ්‍යාව තුල සියලු බඳවා ගැනීම් සිදුකිරීමට, ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රකාශන අනුව සේවක වැටුප් වෙනුවෙන් එම වර්ෂය සඳහා අධිකාරිය දරන ලද සමස්ථ වියදම රු.මිලියන 11,866.2 ක් වූ අතර එකී වියදම පියවා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබූ රජයේ ප්‍රදාන වල වටිනාකම රු.මිලියන 6,500 ක් පමණක් විය. | කර එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | |

**3.10 වාහන පද්ධතිය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු එකම ශ්‍රේණියේ නිලධාරින් හට විවිධ වටිනාකමින් යුතු වාහන අනුයුක්ත කර තිබූ අතර, වාහන වෙන්කිරීම් සම්බන්ධව එකඟ වූ පොදු ප්‍රතිපත්තියක් නොතිබුණි. | යාන්ත්‍රික අංශය විසින් 2020 වසරේ වාහන භාවිතය පිළිබඳව ප්‍රතිපත්ති කෙටුම්පත අනිකුත් අංශවලට අදහස් ලබා ගෙන නැවත සකස් කර ඇති අතර එය විගනන හා කලමණාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට නියමිතව ඇත. | නිලධාරීන හට වාහන වෙන්කිරීම් සම්බන්ධව එකඟ වූ පොදු ප්‍රතිපත්තියක් සකස් කර නිසි අනුමැතීන්ට යටත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් මිලදී ගන්නා වත්කම් සම්බන්ධයෙන් ඇණවුම නිකුත් කරන අවස්ථාවේ සිට එම වත්කම් ඉවත්කරන අවස්ථාව දක්වාත්, ගොඩනගන වත්කම් සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ වල සිට ප්‍රාග්ධනිත කිරීම දක්වාත් අවශ්‍ය කරන නියාමනයන් සිදුකිරීම පිණිස වත්කම් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඔබගේ විගණන ඡේදය හා සම්පූර්ණයෙන් එකඟ විය නොහැක.<br><br>එසේ වුවද වත්කම් කළමණාකරනය පිළිබඳව අංග සම්පූර්ණ පද්ධතියක් ස්ථාපිත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අධිකාරිය සඳහා යෝග්‍ය වත්කම් කළමණාකරණ පද්ධතියක් වහාම ස්ථාපිත කිරීම සඳහා පියවර ගත යුතුයි. |